**NVQ ක්‍රමවේදය තුලින් නිපුණතාවයට හා සේවා පලපුරුද්දට නිපුණතා බලපත්‍රයක්**

ඔබේ සියලු නිපුනතාවයන්/සුදුසුකම් සහ පලපුරුද්ද සුහුරු කාඩ්පතක් (SMART CARD)මගින් තහවුරු කිරීම නිපුණතා බලපත්‍රය මගින් ඉටු කරනු ලබයි. ඔබ සතු NVQ සහතිකය, සේවා පලපුරුද්ද පිළිබඳ තොරතුරු සෘජුවම www.nsp.gov.lk වෙබ් අඩවිය වෙත හෝ දුරකථන අංක 0117608067 මගින් විමසා අවශ්‍ය පරිදි ඉදිරිපත් කර නිපුණතා බලපත්‍රය ලබාගත හැකිය. මේ සඳහා ඇගයීම් කළ නිපුණතාවය සමග අදාල වෘත්තියේ හි වසරක සේවා පලපුරුද්ද සමග සේවයේ නියැලීම අවශ්‍ය වන අතර , රු 1000 ක ගෙවීමක් කිරීමට අවශ්‍ය වේ. පෙර දැනුම ඇගයීම (Recognition of Prior Learning- RPL) ක්‍රමවේදය මගින් NVQ සහතිකය ලබා ගන්නා නිපුණ ශිල්පීන්ට NVQ සහතිකය ලබා ගැනීමත් සමග "නිපුණතා බලපත්‍රය" (Skills Passport) ලබාගැනීම සඳහා අයදුම් කළ හැකිය.

**සහතික කළ නිපුණතාවයට හා පළපුරුද්දට - නිපුණතා බලපත්‍රයක්**

**නිපුණතාව පලපුරුද්ද ඇතුළත් - සුහුරු කාඩ්පතක්**

QR කේතය මගින් තහවුරු කළ හැක

නිපුණතා බලපත්‍රලාභියාට ලැබෙන ප්‍රතිලාභ

- තමාගේ නිපුණතාවයට පිළිගැනීමක් ලැබේ.
- නිපුණතාවය සහ පලපුරුද්ද සියලු දෙනාට අන්තර්ජාලය හරහා තහවුරු කර ගත හැකි වීම.
- දේශීය විදේශීය රැකියා අවස්ථාවන් සඳහා මංපෙත් විවර කර දීම.
- අධ්‍යාපන සහ සේවා සහතික ගොනුවක් වෙනුවට සුහුරු කාඩ්පතක් භාවිතා කළ හැකි වීම.
- දේශීය හෝ විදේශ රැකියාවකදී ලබාගත් නිපුණතාවය හා පලපුරුද්ද මත පදනම්ව NVQ සහතිකය සහ නිපුණතා බලපත්‍රය ලබාගත හැකිවීම.

සේවා යෝජකයාට ලැබෙන ප්‍රතිලාභ

- රාජ්‍ය පිළිගැනීමක් ඇති නිපුණතාවය තහවුරු කළ/පිළිගැනීමක් ඇති නිපුණ ශිල්පීන් රැකියා අවස්ථා සඳහා බඳවා ගැනීමට හැකි වීම.
- අදාල නිපුණ ශිල්පියාගේ නිපුණතාවය සහ පලපුරුද්ද මාර්ගගත ක්‍රමය ඔස්සේ තහවුරු කර ගත හැකි වීම.
- නිපුණ ශිල්පීන් බඳවා ගැනීම සඳහා ගතවන කාලය සහ පිරිවැය අවම කරගත හැකි වීම.

- එදිනෙදා අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය වන වෘත්තිකයන්ගේ නිපුනතාවය හා පලපුරුද්ද තහවුරු කර ගැනීමට හැකිවීම.

සුදුසුකම් නිර්ණායක - අයදුම්කරු

- ශ්‍රී ලංකා පුරවැසියෙකු වීම.
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) ලියාපදිංචි ආයතනයකින් NVQ සහතිකයක් ලබා ගැනීමෙන් අනතුරුව වසරක සේවා පලපුරුද්දක් තිබීම හෝ පෙර දැනුම ඇගයීම (RPL) තුලින් ලබාගත් NVQ සහතිකයක් තිබීම.

අයදුම්කිරීමේ ක්‍රියාවලිය

- www.nsp.gov.lk වෙත පිවිස "Apply today" මත ක්ලික් කරන්න.
- අවශ්‍ය තොරතුරු සහ මූලික අයදුම්පත පුරවන්න.
- මූලික අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු අයදුම්කරුට අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම්,සේවා පළපුරුද්ද, භාෂා නිපුණතාවය යනාදිය පද්ධතියට ඇතුළත් කිරීම සඳහා පිවිසුම් තොරතුරු සහ ඊට සම්බන්ධ සියලුම උපකාරක ලියකියවිලි වල ස්කෑන් කරන ලද පිටපත් ද උඩුගත Upload කළ යුතුය.

සටහන :- සපයනු ලබන තොරතුරු අදාළ අධිකාරීන්/ආයතන/සංවිධාන සමග අප විසින් තහවුරු කරගනු ලැබේ.

- අයදුම්කරු රු 1000 ක ගාස්තුවක් සෘජුවම TVEC ආයතනය වෙත හෝ අදාල නම් කර ඇති බැංකු ගිණුමට  බැරකළ යුතුය. ගෙවීම් ලදු පතෙහි ස්කෑන් කළ පිටපතක් නිපුණතා බලපත්‍ර (Skills Passport) පද්ධතියට උඩුගත Upload කළ යුතුය.
- සෑම අදියරකදීම අයදුම්කරු වෙත SMS දැනුම්දීම යවනු ලැබේ. අයදුම්කරුහට අවසාන SMS දැනුම්දීම ලැබීමෙන් පසු නිපුණතා බලපත්‍ර කාඩ්පත (Skills Passport Card) TVEC ආයතනය වෙතින් ලබාගත හැක.

රැකියාව පිළිබඳ සාක්ෂි

- අයදුම්කරු සේවයේ නියුතු නම් සහ EPF සහ ETF සඳහා දායක වන්නේ නම් රැකියා තොරතුරු තහවුරු කර ගැනීමට ඒකකයට හැකියාව ලබාදෙමින්  අදාල ගෙවීම් ප්‍රකාශවල පිටපත් නිපුණතා බලපත්‍ර ඒකකයට (Skills Passport Unit) උඩුගත Upload කළ යුතුය.

- අයදුම්කරු ඔහුගේ/ඇයගේ සේවා යෝජකයා විසින් නිකුත් කරන ලද රැකියාව තහවුරු කිරීමේ ලිපියක් නිපුණතා බලපත්‍ර ඒකකයට උඩුගත Upload කළ යුතුය.
- අයදුම්කරු ව්‍යාපාර හිමිකරුවෙකු වන විට ව්‍යාපාර ලියාපදිංචියේ (BR) පිටපතක් සහ එම ලිපිය ලැබුණු දිනට අදාළ ව්‍යාපාරය ක්‍රියාත්මක වන බවට අදාළ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීවරයා අදාල ආකෘතිය පරිදි උඩුගත Upload කළ යුතුය.
- අයදුම්කරු විදේශ රැකියාවක නිරත සිටින විට ඔහු/ඇය ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් නිකුත් කරන ලද සහතිකයේ පිටපතක්, සේවා යෝජකයා විසින් නිකුත් කරන ලද සේවා ලිපියක්, වීසා බලපත්‍රයේ පිටපතක් උඩුගත Upload කළ යුතුය.
- 500 කට අධික ජාතික නිපුනතා සම්මත (www.nvq.gov.lk) අතරින් ඔබට ගැලපෙන වෘත්තිය තෝරාගත හැක.

**වැඩි විස්තර සඳහා අමතන්න**


දිනූෂා ලක්මාලි 0117608067

0703206915

විද්‍යුත් තැපෑල skillspassport@tvec.gov.lk

dinushalakmali5u@gmail.com